ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව
காணி ஆணையாளர் நாயகத்தின் திணைக்களம்
LAND COMMISSIONER GENERAL'S DEPARTMENT

"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය, 1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.
"மிஹிகதமெதுர", காணிச் செயலகம், 1200/6, ரஜமல்வத்த வீதி, பத்தரமுல்ல.
"Mihikatha Medura", Land Secretariat, 1200/6, Rajamalwatta Road, Battaramulla.

මගේ අංකය / எனது இல / MY NO: 4/1/චක්‍රලේඛ 2012,2013
ඔබේ අංකය / உமது இ இல / YOUR NO:
දිනය / திகதி / DATE: 2013.08. 26

චක්‍රලේඛ අංක 2013/5

සියලුම පළාත් ඉඩම් කොමසාරිස්වරුන් /
සියලුම නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරුන් /සහකාර ඉඩම් කොමසාරිස්වරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

**<u>රජයේ ඉඩම් ආඥා පනතේ 223 නියෝගය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට / නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම් පැවරීම.</u>**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියට /නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම් පැවරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ඉඩම් නියෝග 223 යටතේ පනවා ඇති නමුත් මෙම පැවරීම් සඳහා වන පරිශිෂ්ඨයක් එම ඉඩම් නියෝග යටතේ හඳුන්වා දී නොමැත.

මෙම ආයතනවලට ඉඩම් පැවරීමේදී මෙතෙක් භාවිතා කරන ලද්දේ 14 පරිශිෂ්ඨය වන අතර එය භාවිතා වන සමහර අවස්ථාවලදී ගැටලු සහගත තත්ත්වයන් පවතින බව ක්ෂේත්‍රයේ බොහෝ දෙනා විසින් පෙන්වා දෙනු ලැබූ අදහස් ද සැලකිල්ලට ගෙන ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව මේ සඳහා සුදුසු පරිශිෂ්ඨයක් සකස් කර හඳුන්වා දීමට අදහස් කර ඇත.

ඒ අනුව ඉඩම් නියෝග 223 හි ප්‍රතිපාදන යටතේ මේ සමග අමුණා ඇති පරිශිෂ්ඨය හඳුන්වා දෙනු ලබන අතර මින් ඉදිරියට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සහ නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම් පැවරීමේදී එම පරිශිෂ්ඨය භාවිතා කරන මෙන් කාරුණිකව දන්වමි.

ආර්.පී.ආර්. රාජපක්ෂ
ඉඩම් කොමසාරිස් ජනරාල්.

පිටපත්:
1. ලේකම් - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය
2. සභාපති - ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
3. සභාපති - නාගරික සංවර්ධන අධිකාරිය
4. ලේඛණ භාර කළමනාකරණ සහකාර

දුරකථනය / தொலைபேசி / Telephone: 011-2797400
ෆැක්ස් / பெக்ஸ் / Fax: 011-2864051
වෙබ් ලිපිනය / இணையம் / Web Address: www.landcommdept.gov.lk
ඊමේල් / ஈ-மெயில் / E-mail: landcom@landcommdept.gov.lk

**රජයේ ඉඩම් ආඥා පනතේ 223 වන නියෝගය යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට /නාගරික සංවර්ධන අධිකාරියට ඉඩම් පැවරීම සඳහා වූ වාර්තාව.**

(1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 17(1) වැනි වගන්තියේ සැලසී ඇති ප්‍රතිපාදන පරිදි රජයේ ඉඩම් ආඥා පනතේ 6(1) වගන්තියෙන් ඉඩම් පැවරීම)

අ). ඉඩමේ නම:

ආ). පිහිටීම:
1. දිස්ත්‍රික්කය:
2. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය:
3. ග්‍රාම නිලධාරී වසම:
4. පළාත් පාලන ආයතනය:

ඇ).
1. පිඹුරු අංකය:
2. කැබලි අංකය:
3. ප්‍රමාණය: (පිඹුර හෝ අනුරේඛණය අමුණන්න.)

ඈ). ඉඩම ඉල්ලා ඇති කාරණය: (ව්‍යාපෘති වාර්තාව හෝ යොදා ගන්නා අරමුණ පැහැදිලි කරන්න.)

ඉ). නිර්දේශ කරන ඉඩම් ප්‍රමාණය:

ඊ). ඉඩම විෂයයෙහි රජයේ අයිතිය:
1. රජයේ ඉඩමක්ද?
2. අත්පත් කර ගත් ඉඩමක්ද?
3. අත්පත් කර ගන්නා අරමුණ සහ ආයතනය
4. වෙනත් ආයතනයක් සඳහා අත් කර ගත් ඉඩමක් නම් එම ආයතනයේ එකඟතාවය ලැබී තිබේද?

උ). ඉඩමේ භෞතික තත්ත්වය:
1. ඉඩමේ වටිනා දැව තිබේද? එසේ නම් ඉවත් කරන්නේ කෙසේද?
2. ඉඩමේ ගොඩනැගිලි ඇද්ද? ඉදි කළේ කවුරුන් විසින්ද? එහි වටිනාකම
3. ඉඩම අනවසර අල්ලා ගැනීම්වලින් තොරව තිබේද?

ඌ). අපේක්ෂිත කාර්යය සඳහා ඉඩම නිදහස්ව තිබේ ද යන්න හා ඒ සඳහා යෝග්‍ය ද යන බව:

එ). ඉඩම වෙනත් කටයුත්තක් සඳහා දැනටමත් වෙන් කර තිබේද එසේ නම් විස්තර:

ඒ). මෙම ඉඩම වෙනත් කාර්යයන් සඳහා මැන සැලසුම් කර තිබේද? එසේ නම් එහි පිඹුරු අංකය:

ඔ). මෙම ඉඩම ලබා දීමෙන් පාරිසරික හානියක් සිදු වෙතැයි අදහස් කරන්නේද?

ඕ). ඉඩමේ දියුණු / නොදියුණු වටිනාකම:

ක). ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය:

...............................
ප්‍රාදේශීය ලේකම්.
("ක" අක්ෂරය යටතේ නිර්දේශ ලබා දීමේදී ඉඩම් පැවරීමේ අරමුණ ඇත්ලත් කරන්න.එසේම 6(1) වගන්තිය යටතේ ප්‍රාදේශීය ලේකම් විසින් නිර්දේශ කරනු ලබන්නේ විශේෂ දීමනාවක් වශයෙන් ද නැතහොත් බදු වශයෙන් ද යන්න පැහැදිලිව සඳහන් කරන්න.)